# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
# அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/SDA/04/02/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.03.22 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්
සියළුම දිස්ත්‍රික් ලෙකම්වරුන්

**<u>ජාතික රක්ෂණ භාර අරමුදලේ අග්‍රහාර අවකරණ මුදල් අන්තර් බැංකු (SLIPS) ක්‍රමය මගින් සෘජුවම බැංකුගත කිරීම සඳහා නව ක්‍රමයක් හඳුන්වා දීම.</u>**

2024 ජනවාරි මස සිට අවකරණ ලැබීම් හා අග්‍රහාර හිමිකම් අයදුම්පත් වලට මුදල් ප්‍රතිපූර්ණය කිරීම තවදුරටත් කාර්යක්ෂම කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සැලසුම් කර ඇත. ඒ සඳහා දැනට NEW CIGAS මෘදුකාංගය හරහා SLIPS කරන ලද අවකරණවලට අදාල නිළධාරින්ගේ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කරගැනීම අවශ්‍ය බව ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිළධාරි විසින් මා වෙත එවන ලද 2024.03.19 දිනැති ලිපියෙන් සඳහන් කර තිබේ.

02.මගේ සමාංක SA/SD/04/02/01 හා 2023.12.13 දින නිකුත් කරන ලද රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 01/2022 මගින් NEW CIGAS මෘදුකාංගය හරහා දැනටමත් ඔබ වෙත මෙම පහසුකම් සලසා දී ඇති හෙයින් එහි සඳහන් මාර්ගෝපදේශ අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. (ජාතික රක්ෂණ භාර අරමුදලේන් විශේෂ කොට පෙන්වා දි ඇති කරුණු ඔබගේ දැනගැනිම පිනිස සිංහල,දමිළ හා ඉංග්‍රිසි යන මාධ්‍ය තුනෙන්ම මෙයට යාකොට ඇත.)

(ඇමුණුම් 03යි)

..................................
ඩබ්.ඒ.සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව  பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.  General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600  Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax +94 11 2484869
Fax +94 11 2473856
Website www.sad.gov.lk
e-mail dgsa@sad.treasury.gov.lk

**<u>ජාතික රක්ෂණ භාර අරමුදලේ අග්‍රහාර අවකරණ මුදල් NEW CIGAS මෘදුකාංගය භාවිතා කරමින් අන්තර් බැංකු ක්‍රමය (SLIPS) මගින් සෘජුවම අරමුදලේ ගිණුමට බැර කර ගැනීමට අදාළ පොදු උපදෙස් මාලාව</u>**

රාජ්‍ය ආයතනවල නිළධාරීන් සඳහා ක්‍රියාත්මක අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාළ අවකරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ NEW CIGAS මෘදුකාංගය භාවිතා කරමින් ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය හරහා ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමුකරනු ලබයි.

ඉහත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම මගින් රාජ්‍ය නිළධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක යටතේ මාසික අවකරණ ලැබීම් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන කරගැනීමට හැකියාව ලැබී ඇත. එම නිසා ආයතනවල නිළධාරීන්ගේ අග්‍රහාර අවකරණ හිමිකම් ගෙවීම්දී ඇතිවන ප්‍රමාදවීම අවම කරගැනීමට හැකියාව ලැබී ඇත.

2024 ජනවාරි මස සිට අවකරණ ලැබීම් හා අග්‍රහාර හිමිකම් අයදුම්පත් වලට මුදල් ප්‍රතිපූර්ණය කිරීම තවදුරටත් කාර්යක්ෂම කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සැලසුම් කර ඇත. ඒ සඳහා දැනට **NEW CIGAS** මෘදුකාංගය හරහා **SLIPS** කරන ලද අවකරණ වලට අදාළ නිළධාරීන්ගේ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කරගැනීම අවශ්‍ය වේ.

- Government Payroll මෘදුකාංගයේ **Reference Number Column** එක තුළට නිළධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නොමැති නම් එය අනිවාර්යයෙන්ම පහත ආකාරයට ඇතුළත් කිරීමට කටයුතු කරන්න (නිළධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක සඳහන් වී නොමැති වීම මගින් ඔවුන්ගේ අවකරණ වෙන වෙනම ගිණුම්ගත කිරීමට නොහැකි වන බැවින් ඒවා නිවැරදිව ඇතුළත් කිරීම කළ යුතුය. අග්‍රහාර අයදුම්පත් වලට හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමේදී එය අනිවාර්ය වන බව සලකන්න).

  පැරණි ජාතික හැඳුනුම්පත් අංක: ඉලක්කම් 9කින් (9 digits) යුත් පැරණි ජාතික හැඳුනුම්පත් අංකය සමඟ හිස්තැනක් රහිතව ඉංග්‍රීසි කැපිටල් V හෝ X අක්ෂරය යොදන්න (Enter V or X letter without adding a space after the numbers of the NIC). උදාහරණ: 999999999V

  නව ජාතික හැඳුනුම්පත් අංක: ඉලක්කම් 12කින් (12 digits) යුත් නව ජාතික හැඳුනුම්පත් අංකය පමණක් යොදන්න. උදාහරණ: 191111111111

- නිළධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කිරීමේදී ඒ වෙනුවට නිළධාරීන්ගේ සේවා අංක (Employee Numbers) හෝ ඉංග්‍රීසි අක්ෂර (English Letters) හෝ වැනි විවිධ වෙනත් සංකේත (Symbols) ඇතුළත් කිරීම නොකළ යුතුය. පැරණි හෝ නව ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කරන විට ජාතික හැඳුනුම්පත් අංකයක් සමන්විත විය යුතු අනිවාර්ය ඉලක්කම් සංඛ්‍යාව ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ජාතික හැඳුනුම්පත් අංක යෙදීමේදී ඉලක්කම් අතර වුවද හිඩැස් නොතැබීමට වග බලා ගැනීමට කටයුතු කළ යුතුවේ (Keep the numbers without a space).

- New CIGAS හරහා අග්‍රහාර අවකරණ SLIPS කිරීමේදී තොරතුරු නිවැරදිව හඳුනාගැනීම සඳහා ඔබ ආයතනය වෙත ලබාදී ඇති ලිපිගොනු අංකය (File Number) නිවැරදිව සඳහන් කරන්න. කිසිවිටෙකත් File Number එක සඳහා A හෝ B හෝ ලෙස තනි අක්ෂරයක් සඳහන් නොකර ඔබ ආයතනයට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ලබා දී ඇති File Number එක එය සමන්විත වන ඉලක්කම්ද සමඟ පැහැදිළිව යොදන්න.

  උදාහරණ: 01067A

  01067B

ඔබ ආයතනයට ලබාදී ඇති ලිපිගොනු අංකය A හෝ B හෝ අන්තර්ගත නොවන ඉලක්කම් පහකින් පමණක් සමන්විත ලිපිගොනු අංකයක් වේ නම් එය පැහැදිළිව ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

උදාහරණ: 01001

- අග්‍රහාර අවකරණ මුදල් New CIGAS මෘදුකාංගය හරහා SLIPS කිරීම නිළධාරීන්ගේ වැටුප් දිනවලදීම සිදුකරන්න. අග්‍රහාර හිමි සියලු නිළධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකයන් නිවැරදි බව සනාථ කර එම අදාළ මාසයට අයත් වැටුප් අවකරණ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි AWP පද්ධතිය වෙත Upload කිරීමට කටයුතු කරන්න.

- තවද, New CIGAS මෘදුකාංගය තුළින් නිර්මාණය වන අවකරණ ලේඛන (CSV Files) අදාළ මාසය නිමවීමට පෙර ජාතික රක්ෂණ භාර අරමුදලෙහි AWP පද්ධතිය තුළට Upload කිරීමට කටයුතු කරන්න. අවකරණ ලේඛන කිසිම විටෙක ඊමේල් මඟින් එවීමට කටයුතු නොකරන්න. අග්‍රහාර අයදුම්පත්වලට හිමිකම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඉහත CSV Files Upload කිරීම මඟින් පද්ධතිය තුළ නිළධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම අනිවාර්ය වේ.

- රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ **<u>New CIGAS මෘදුකාංගය පමණක්</u>** භාවිත කර අන්තර් බැංකු ක්‍රමය හරහා අග්‍රහාර අවකරණ SLIPS කිරීම කළ යුතු වන අතර, ඊට අදාළව රාජ්‍ය නිළධාරීන්ගේ තොරතුරු ඇතුළත් අවකරණ ලේඛනවල මෘදු පිටපත් (Soft Copies of the Remittance Lists available in CSV Format) ඊමේල් මඟින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමුකිරීමට කටයුතු නොකොට New CIGAS මෘදුකාංගය මඟින් සැකසුණු File එක ජාතික රක්ෂණ භාර අරමුදලෙහි AWP පද්ධතිය වෙත Upload කිරීමට කටයුතු කරන්න. New CIGAS හරහා create වුණු File එක විවෘත කිරීමකින් තොරව Upload කරන්න.

ජාතික රක්ෂණ භාර අරමුදලේ අග්‍රහාර අවකරණ New CIGAS මෘදුකාංගය භාවිත කරමින් අන්තර් බැංකු ක්‍රමය හරහා බැංකුගත කිරීම පිළිබඳ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022/ 02/ 13 දින නිකුත් කරන ලද රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය 01/ 2022 කෙරෙහි තවදුරටත් අවධානය යොමුකරමින් ඉහත ක්‍රියාවලිය ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා ඊට අවශ්‍ය කටයුතු සිදුකරන්න.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අග්‍රහාර අයදුම්පත් වලට හිමිකම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වන නව අයදුම්පතක් මේ වනවිට යාවත්කාලීන කර ඇත. එම අග්‍රහාර හිමිකම් ප්‍රතිපූර්ණ අයදුම්පතෙහි 10වන කොටසේ සඳහන් කර තිබෙන පෙර මාසයේ චෙක්පත් පිළිබඳ විස්තර වෙනුවට SLIP පතෙහි සඳහන් මුදල සහ දිනය පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

ඉහත ක්‍රියාවලිය සම්බන්ධයෙන් තවදුරටත් යම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය නම් 076 429 1312 - රක්ෂණ නිළධාරී (අග්‍රහාර ආදායම් අංශය) හෝ 077 581 0572 යන දුරකථන අංක ඔස්සේ ලබාගත හැකිය.

ගමානි එන්. ලියනාරච්චි
ප්‍රධාන විධායක නිළධාරී,
ජාතික රක්ෂණ භාර අරමුදල